# ශ්‍රී ලංකා රජයේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු
චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග
මැතිනිය විසිනි.

කොළඹ, ශ්‍රී ලංකාව 1994 සැප්තැම්බර් 13 වන දින

6635

6635
808 51



"......... යෝග්‍ය වූ ණය සහ මූල්‍ය ප්‍රතිපත්ති මගින් කෘෂිකර්මය, කර්මාන්ත, යටිතල පහසුකම් සංවර්ධනය වැනි අංශයන්හි නව නිෂ්පාදනයෙහි යෙදෙන්නට අවශ්‍ය පහසුකම් සැලසීමෙන් සහ ඒවා දිරි ගැන්වීමෙන් පෞද්ගලික අංශයේ විෂය ක්ෂේත්‍රය ව්‍යාප්ත කරනු ලැබේ."

# ශ්‍රී ලංකා රජයේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශය

නිදහස් වෙළඳපල රාමුවක් තුළ ශක්තිමත් ජාතික ආර්ථිකයක් ගොඩ නැගීමට රජය ඇප කැප වී සිටී. දේශීය හා විදේශීය පෞද්ගලික අංශය සංවර්ධනයේ ප්‍රධාන යන්ත්‍රය විය යුතු යැයි අපේක්ෂා කෙරේ. රජයේ කාර්යභාරය වනුයේ පෞද්ගලික අංශයේ සීඝ්‍ර සංවර්ධනය සඳහා පූර්ණ සහාය සලසන ආයතනික රාමුවක් සැකසීමය. මේ කාර්යය හොඳින් ඉටු කිරීම සඳහා වෙළඳපල ක්‍රියාදාමයක් යටපත් නොකර 'වෙළඳපල හිතකර' ප්‍රතිපත්ති රජය විසින් අනුගමනය කෙරේ. මේ අනුව, රජය විසින් වෙළඳ පලෙහි මැදිහත්වීම එම වෙළඳ පලෙහි දුර්වල හා නොදියුණු අංශවලට පමණක් සීමා වනු ඇත. එවිට වෙළඳපල ශක්තිමත්වීමෙන් මහජනයාගේ සුභ සාධනයට මග පෑදෙනු ඇත.

මෙම ප්‍රතිපත්තීන් සාර්ථකවීමට නම් උද්ධමනය අඩු කර ගැනීමටත්, සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ඇති කරලීමටත්, ඵලදායි රැකියා අවස්ථා ඇති කරලීමටත් සහ සංවර්ධනයේ ප්‍රතිඵල සාධාරණ අන්දමින් බෙදී යාමටත් හිතකර වූ සමස්ත හෙවත් සාර්ව ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් අත්‍යවශ්‍ය වනුයේය.

ආර්ථික උපාය මාර්ග ශක්තිමත් කරනු ලබන විවිධ ක්‍රියාමාර්ග තුළින් මෙම ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කෙරේ. පළමුව, වෙළඳපලේ දිරිගැන්වීම් ඇති කරන සංඥා දුර්වල කිරීමට හේතු වන කිසිදු පියවරක් ගනු නොලැබේ. දේශීය හා විදේශීය පෞද්ගලික දේපල ජනසතු කිරීමට හෝ රජයට ගැනීමට හෝ සැලසුම් කිසිවක් නැත. දැනට වලංගු සියළුම ද්විපාර්ශවීය ආයෝජන ආරක්ෂක ගිවිසුම් සහ ජාත්‍යන්තර සම්මුතීන් නොවෙනස්ව පිළිගනු ලැබේ. විදේශ ආයෝජකයන් විසින් තම ලාභාංශ සහ මූලධනය ආපසු යැවීම පිළිබඳ සීමා පනවන්නේ නැත. දැනටමත් ක්‍රියාත්මක වන විදේශීය විනිමය ගනුදෙනු ලිහිල් කිරීමේ ප්‍රතිපත්තිය තවදුරටත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වන අතර, එම ප්‍රතිපත්ති තව තවත් ලිහිල් කෙරේ. මෙරට සීඝ්‍ර සංවර්ධනයක් සඳහා අවශ්‍ය ආයෝජන මුදල් සපයා ගැනීමට දේශීය ඉතිරි කිරීම් ප්‍රමාණවත් නොවන බැවින්, උචිත පෙළඹවීම් මගින් විදේශීය පෞද්ගලික ආයෝජන තරයේ දිරි ගන්වනු ලැබේ. නොයෙක් මාදිලියේ හිතුවක්කාර වරප්‍රසාද විදේශිකයන්ට ලබා දෙන ආයතනයක් වූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙරටෙහි විදේශ

ආයෝජනය පැහැදිලි අන්දමින් සහ නියම ආකාරයට දිරි ගන්වන ආයතනයක් බවට නැවත සකස් කරනු ලැබේ.

දෙවනුව, විදේශීය ආයෝජනවලට අදාළ කම්කරු ප්‍රතිපත්ති පිළිබඳ අහිතකර වෙනස්වීම් කිසිවක් සිදු නොකෙරෙනු ඇත. රැකියා විරහිතව සිටින විශාල පිරිස්වලට රැකියා සැපයීමෙහිලා රජය ඇති කරන උපාය මාර්ගයට මේ ප්‍රතිපත්තිය ඉතා වැදගත් වන්නේය. පාලකයන් සහ කම්කරුවන් අතරේ සුහද සම්බන්ධතාවය වැඩි දියුණු කරන උපදේශක මණ්ඩල, ආයෝජන මණ්ඩලයේ පාලනය යටතේ සෑම සේවා ස්ථානයකම පිහිටුවනු ලැබේ.

තෙවනුව, යෝග්‍ය වූ ණය සහ මූල්‍ය ප්‍රතිපත්ති මඟින් කෘෂිකර්මය, කර්මාන්ත, යටිතල පහසුකම් සංවර්ධනය වැනි අංශයන්හි නව නිෂ්පාදනයෙහි යෙදෙන්නට අවශ්‍ය පහසුකම් සැලසීමෙන් සහ ඒවා දිරි ගැන්වීමෙන් පෞද්ගලික අංශයේ විෂය ක්ෂේත්‍රය ව්‍යාප්ත කරනු ලැබේ. මෙම පහසුකම් පොදුවේ සියළු දෙනාටම සාධාරණව සලසා දෙනු ලැබේ. එම නිසා, විශේෂ වරප්‍රසාද සහ අනුග්‍රහ බලාපොරොත්තුවෙන් රජයට බලපෑම් කිරීමේ අවශ්‍යතාවයක් පෞද්ගලික අංශයට නොඑළඹෙනු ඇත. මෙයින් අදහස් කෙරෙන්නේ රජයේ මූල්‍ය සහ වෙනත් සැපයුම් සහ සේවා සියළු දෙනාටම පොදුවේ හා සාධාරණ ලෙස සැපයෙන බවයි. දූෂණය හා හිතවාදීකම් තුරන් කරලීමේ අටියෙන් සියළුම සේවා සහ උපකාර කාහටත් පැහැදිලිව විද්‍යමාන වන අයුරින් ක්‍රියාත්මක කිරීමට වග බලාගනු ලැබේ. ඉකුත් රජයේ ඇතැම් සැක සහිත වූද, වංචා සහගත වූද සමහර ගණුදෙනු, අනාගතයේදී එබඳු අයථා කටයුතු වැළැක්වීමේ අදහසින්, සමාලෝචනය කර බැලීමට අපට සිදුවී තිබේ. මේ කාර්යයේ දී රජය පිළිගත් ජාත්‍යන්තර සහ නීත්‍යානුකූල ගිවිසුම් නොවෙනස්ව පිළිපැදීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ.

සිව්වනුව, යෝජිත ජාතික සංවර්ධන මණ්ඩලය රාජ්‍ය නිලධාරීන්, උගතුන්, පෞද්ගලික අංශයේ පාලකයින් සහ කම්කරු නියෝජිතයින් සමන්විත වන පරිදි පිහිටවනු ලැබේ. මෙම මණ්ඩලය ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරන අතර, ඒවායේ ප්‍රමුඛත්වයන් ද තීරණය කරයි. පෙරදිග ආසියාවේ දක්නට ලැබෙන පරිදි, වෙළෙඳපල යන්ත්‍රණය ජාතික ශුභසිද්ධිය සඳහා ශක්තිමත් කිරීම අරමුණු කොට ගෙන පෞද්ගලික අංශයත් රජයත් අතර ඵලදායි සංවාදයක් ඇති කිරීමට මෙමගින් පහසුකම් සැලසෙනු ඇත. එමගින් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී පෞද්ගලික අංශයේ අදහස් උදහස් සැලකිල්ලට ගනු ලැබේ. මෙම මණ්ඩලයේ සිටින කම්කරු නියෝජිතයන්ගේද, ව්‍යාපාර පාලකයන්ගේද,

රජයේ නියෝජිතයන්ගේද අදහස් හුවමාරුවීම් තුළින් දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීමටත්, ආර්ථික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය වූ අන්‍යෝන්‍ය සහයෝගය ගොඩනැගෙනු ඇත.

පස්වනුව, රජයේ මැදිහත්වීම වෙළඳපලෙහි ඵලදායි සහ සාර්ථක ලෙස ක්‍රියාත්මකවීමට අපොහොසත් ක්ෂෙත්‍රවලට පමණක් සීමා කෙරෙනු ඇත. මෙම කටයුතු ප්‍රධාන වශයෙන්ම මානව සංවර්ධන පොදු ක්ෂෙත්‍රයට ඇතුළත් වේ. නිදසුනක් වශයෙනු, නූතන ආර්ථිකයේ අවශ්‍යතාවයන්ට අනුකූලව අපේ තරුණ පිරිස් හැඩගස්වනු පිණිස අධ්‍යාපන අංශයේ තත්ත්වය සහ තාක්ෂණික ප්‍රවනතාවය වැඩි දියුණු කිරීමට අවශ්‍යතාවයක් පවතී. මේ කාර්යය ශ්‍රී ලංකාවේ සමාජයීය හා සංස්කෘතික උරුමය මත පදනම් වූ ජාතික අනන්‍යතාව මත ස්ථිර වශයෙන්ම ගොඩනැගෙනු ඇත. එමෙන්ම, අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ප්‍රතිඥා දී ඇති පරිදි සෞඛ්‍ය සේවා සඳහා ද, පරිසරය ආරක්ෂා කරනු සඳහා ද, දිළිඳුකම තුරන් කිරීම උදෙසා සැකසූ 'සමෘද්ධි' වැනි ව්‍යාපෘති මගින් දිළිඳු ජනතාවගේ රැකවරණය සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂා ජාලයක් ඇති කිරීමට ද රජයේ මැදිහත්වීම අවශ්‍ය වී තිබේ. මෙම ක්ෂෙත්‍රවලට රජයේ මැදිහත්වීම සහ ආයෝජනය ප්‍රමාණවත් අන්දමින් සිදු නොවුවහොත්, අප ඇප කැප වී සිටින චිරස්ථායි මානව සංවර්ධනය බලාපොරොත්තු විය නොහැක. ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා ගනු ලබන පියවර සමගම රැකියා සහ ආදායම් උපයන මාර්ග සුලබ කළ යුතුව තිබේ.

හයවනුව, පෞද්ගලික අංශයේ සීඝ්‍ර වර්ධනයට අවශ්‍ය කරන යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා රජයේ ආයෝජන අවශ්‍ය වන්නේය. එසේ වුවද, ප්‍රමාණවත් මූලික පහසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය සම්පත් ප්‍රමාණය අති විශාල වන බැවින් යටිතල පහසුකම් පිළිබඳ ආයෝජනවලින් සැලකිය යුතු කොටසක් පෞද්ගලික අංශය විසින් කළ යුතුව තිබේ. මේ අන්දමින් පෞද්ගලික ආයෝජන අප අපේක්ෂා කරනුයේ මහා මාර්ග, බලශක්ති, විදුලි සංදේශ සහ වරාය යනාදී ක්ෂෙත්‍රවල යටිතල පහසුකම් ඇති කිරීම සඳහා රජය දරණ වියදම්වලට වැඩිමනත්වයි. රජයේ අනුග්‍රහය යටතේ පෞද්ගලික අංශය විසින් එවැනි යටිතල පහසුකම් ඉදිකොට, නියමිත කාලයක් තුළ එම සේවා සීමිත පරිහරණ ගාස්තු අයකරමින් ක්‍රියාත්මක කොට, තමන් ආයෝජනය කළ ධනයට අවශ්‍ය ප්‍රතිලාභ ලබාගෙන, එම පරිහරණ කාලය අවසානයේදී තම ව්‍යාපාරය ආපසු රජයට භාරදීමේ 'සීමිත පරිහරණ සේවා' ක්‍රමයට හෝ පහසුකම් ඉදි කොට අසීමිත කාලයකට යටිතල සේවා සපයන 'අසීමිත පරිහරණ සේවා' ක්‍රමයට අනුකූලව පෞද්ගලික අංශයට මේ ක්ෂෙත්‍රයේ සහභාගිවීමට

ඉඩ සලසනු ලැබේ. මෙවැනි ව්‍යාපාර සාධාරණව අගැයීමට සහ දිරිගැන්වීම උදෙසා 'යටිතල පහසුකම් සංවර්ධන සහ ආයෝජන කාර්යාලයක්' පිහිටුවා ඇත. එම කාර්යාලය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කිට්ටුවෙන් සහ සහයෝගයෙන් ක්‍රියාත්මක වනු ඇත.

# කෙටි කාලීන ප්‍රතිපත්ති

මෙම උපාය මාර්ගයන් කෙටි කාලීන සහ දිගු කාලීන වශයෙන් ක්‍රියාත්මක වේ. ජීවන වියදම් අඩු කිරීම මගින් දුප්පත්කම තුනී කිරීමට ක්ෂණික කෙටි කාලීන අවශ්‍යතාවයක් අද පවතී. අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි පොරොන්දු වී ඇති ආහාර මිල අඩු කිරීම වැනි ජීවන වියදම පහත හෙලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන්නේ නැවත උද්ධමනය ඇති නොවන ලෙස රජයේ මුදල් අරපරිස්සමින් හසුරුවමිනි. ඉකුත් රජයෙන් උරුම වී තිබෙන මහා මුදල් නාස්තිය හේතු කොට ගෙන මේ කාර්යය ඉටු කිරීම අති දුෂ්කර වී තිබේ. මේ සඳහා මහ බැංකුවෙන් නව ණය මුදල් ලබාගතහොත් නිරායාසයෙන්ම නැවත මිල මට්ටම ඉහළ යනු ඇත. එම නිසා එවැනි උද්ධමනකාරී ණය ගැනීම්වලට නැඹුරු නොවී, අයවැය හිඟය දැරිය හැකි මට්ටමකට සීමා කිරීම සඳහා සියළුම ප්‍රයත්නයන් දරනු ඇත. නව මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම නිසා භාණ්ඩවල මිල අඩු කිරීමෙන් ඇති කිරීමට බලාපොරොත්තු වන ජීවන වියදම් සහනය සම්පූර්ණයෙන් අතුරුදන්වීමට හේතු වේ. එපමණක් නොව, අපගේ අපනයන ශක්තිය දුර්වල වී, ආනයන වැඩිවී, වෙළඳ තුලනය අවාසි වී, අප රැස් කර ගත් විදේශ ධන සංචිත දියවී යා හැකිය. එබැවින් මොනයම් හේතුවක් නිසාවත් මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමට නොපෙළඹෙනු ඇත. තවද, උද්ධමනකාරී මුදල් සැපයීම සඳහා ඇතිවිය හැකි බලපෑම්වලින් මහ බැංකුව ආරක්ෂා කර ගැනීමට හැම රැකවරණයක්ම යොදනු ලැබේ.

මෙම සීමාවන් යටතේ කෙටි කාලීන වශයෙන් රජයට විකල්ප ප්‍රතිපත්තිමාලා දෙකක් තිබේ. ඉන් එකක් නම්, රජයට අතිරේක ආදායම් මාර්ග ඇති කිරීමයි. දෙවනුව, රජයේ වියදම් සීමා කර ගැනීම සහ ඊට අදාළ ශුභ සාධන වියදම් සහනාධාර අතිශයින්ම අවශ්‍ය දුප්පතුන්ට සීමා කිරීමයි.

පළමු වන විකල්පය සම්බන්ධයෙන් අසීමිත සහ හිතුවක්කාර ලෙස ආනයන තීරුබදුවලින් සමහරුන් නිදහස්කිරීම සහ අනවශ්‍ය ලෙස ආදායම් බදුවලින් නව ව්‍යාපාර නිදහස් කිරීම වැනි ප්‍රතිපත්තිවලින් වැළකී සිටීමෙන් අනාගතයේදී රජයේ ආදායම් වැඩි කර ගනු ලැබේ. මේ හැරුණු විට, බදු

ඵලදාව සහ කාර්යක්ෂමතාව වැඩි වන පරිදි බදු අය කිරීමේ ක්‍රමය ප්‍රතිශෝධනය කරනු ලැබේ. මෙයින් අදහස් කෙරෙන්නේ ව්‍යාපාර සමාගම් හා පෞද්ගලික යන දෙඅංශයෙන් අයකැරෙන ඍජු බදු ප්‍රතිශත ක්‍රමිකවූ අඩු කිරීම මගින් බදු ගෙවීම පැහැර හැරීම අඩුකොට, බදුගෙවන කොට්ඨාශය පුළුල් කිරීමකි. ඒ අතර, දැනට මුළු පිරිවැටුම මත පනවා ඇති වක්‍රබදු ක්‍රමය ඉවත් කොට, ව්‍යාපාරිකයන් විසින් භාණ්ඩයකට එකතු කරන වටිනාකම මත බදු අයකරමින් වක්‍ර බදු ක්‍රමය විධිමත් කිරීමත් මේ මගින් අදහස් වේ. පෞද්ගලික අංශයේ ව්‍යාප්තියට අහිතකර වන අන්දමේ බදු නියම කිරීමේ අපේක්ෂාවක් නොමැත.

දෙවැනි විකල්පය ගැන කිව හැක්කේ රජයේ වැටුප් ගෙවීම්, රජයේ ණය ආපසු ගෙවීම් සහ ආරක්ෂක වියදම් වැනි විශාල වියදම් නිසා කෙටි කාලීන වශයෙන් රජයේ වියදම් අඩු කිරීම අසීරු කාර්යයක් බවයි. එසේ වුවද, නාස්තිය හා දූෂණය වැළැක්වීමෙන් ද, මුදල් වියදම් කිරීමේදී දැඩි සංයමයක් ඇති කිරීමෙන් ද, රජයේ ඉහළ තනතුරුවල සිටින පුද්ගල සංඛ්‍යාව අඩු කිරීමෙන්ද, එක්තරා ප්‍රමාණයක මුදල් ඉතිරියක් අපේක්ෂා කළ හැකිය. මේ හැරුණු විට උතුරේ ගැටුම් අවසාන කිරීම මගින් නුදුරු අනාගතයේදී නවත් මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකි වනු ඇත. ඒ අතර, මනා ආර්ථික ප්‍රතිපත්ති, යහපත් පරිපාලනය සහ සාමය යළි උදා කරවීම මගින් අපට ආධාර සපයන මිත්‍ර රාජ්‍යයන්ගෙන් අමතර විදේශීය සම්පත් ප්‍රමාණයක් අපේක්ෂා කළහැකි වනු ඇත.

මේ සියළු පියවර මගින්, උද්ධමනයක් ඇති නොවන ආකාරයෙන්, දුප්පත්කම තුරන් කිරීමේ නව වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා ගැනීමට හැකිවනු ඇත.

# දීර්ඝ කාලීන ප්‍රතිපත්ති

අපගේ දීර්ඝ කාලීන ප්‍රතිපත්ති 1995 සිට 2005 වසර දක්වා වූ කාල පරිච්ඡේදය ඇතුළත් වන දස අවුරුදු සැලැස්මක් මත පදනම් වනු ඇත. මෙම සැලැස්ම අඛණ්ඩව තුන් අවුරුදු ප්‍රතිපත්ති සැලසුම් චක්‍රයක් මගින් ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙම සැලැස්මේ ප්‍රධාන අරමුණ වනුයේ සියළුම අංශයන්හි ජාතික නිෂ්පාදනය වේගයෙන් දියුණු කිරීමය. උතුරේ ගැටුම් තත්ත්වය නැවැත්වීම හේතුකොට ගෙන ඇතිවන මුදල් ඉතිරිය (සාමයේ දායාදය) සහ ඒ සමග ලැබෙන විදේශීය ආධාර විනාශ වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීමටත්, විසිරී ඇත අනාථයන් එක් තැන් කිරීමටත් යෙදවිය හැකිය. මීට අමතරව, මනා ප්‍රතිපත්ති නිසා ශ්‍රී ලංකාව කෙරෙහි

ජාත්‍යන්තර විශ්වාසය වැඩිදියුණු වීම මගින් ලබා ගත හැකි නව මූලධන ප්‍රවාහයන් පෞද්ගලික අංශයෙහි ඵලදායි ආයෝජනයන්ට යොමු කර ගත හැකිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථික වර්ධනය සීඝ්‍රයෙන් වැඩි වී වර්ෂ 2000 වන්නට කලින් 8%ක වාර්ෂික වර්ධනයක් ලබා ගත හැකිය. එමගින් මෙතැන් සිට අවුරුදු පහක් ඇතුළත දී විරැකියාව සම්පූර්ණයෙන්ම පාහේ තුරන් කර ගත හැකි වේ. අවුරුදු දහයක් ඇතුළත දී ඒක පුද්ගල ආදායම දෙගුණ වනු ඇත.

මෙම ප්‍රතිපත්ති මාලාවේ අවසාන අරමුණ වනුයේ 1993 දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට අටක මට්ටමක පැවති සමස්ථ අයවැය හිඟය, 2000 වර්ෂයටත් පෙර දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 3 සිට 4 දක්වා අඩුකර ගැනීමය. මෙමගින් සැලකිය යුතු ප්‍රමාණයක උද්ධමනය අඩුවීමක් ඇති විය හැකි අතර, සහනදායි විදේශ ආධාර සහ ආයෝජන සැලකිය යුතු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වනු ඇත. ඉහතින් දැක්වූ පරිදි සීඝ්‍ර ආර්ථික වර්ධනය හා බදු ප්‍රතිසංස්කරණ මගින් රජයේ ආදායම් නංවාලනු ඇත. සුභසාධනය ලැබිය යුතු නියම දුප්පතුන්ට හරවා ආධාර වැඩිදියුණු කරනු ඇත. යුද කටයුතු සඳහා කෙරෙන වියදම් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකොට, නාස්තිකාරී වියදම් සීමා කිරීමෙන් සහ සමස්ථයක් වශයෙන් රාජ්‍ය අංශයේ කාර්යභාරය සීමා කිරීමෙන්, රජයේ අයවැයෙහි ජංගම ගිණුමෙහි සැලකිය යුතු අතිරික්තයක් උත්පාදනය කරනු ලැබේ. මෙහි දීර්ඝ කාලීන අරමුණු වනුයේ සමස්ථ අයවැය අතිරික්තයක් ඇතිකර ගැනීම මගින්, ගෙවීමට තිබෙන අති විශාල රාජ්‍ය ණය ප්‍රමාණය පියවා දැමීමයි.

වාර්ෂිකව අපගේ ජාතික ආදායම (එනම්, දළ දේශීය නිෂ්පාදනය) සියයට අටකින් වර්ධනය කර ගැනීමේ මධ්‍ය කාලීන අරමුණ සපුරා ගැනීම සඳහා වැඩි වටිනාකම් එකතු කෙරෙන නිෂ්පාදනය සහ අපනයන ක්ෂේත්‍රය විවිධාංගීකරණය සඳහා පෞද්ගලික අංශය දිරි ගැන්වීම මගින් අපනයනික සංවර්ධනයක් කෙරෙහි අඛණ්ඩ අවධාරණයක් දැක්වීම අවශ්‍ය වේ. එබඳු ප්‍රගතියක් සඳහා ජාත්‍යන්තර වෙළඳ පලෙහි ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය දියුණු කර ගැනීම අවශ්‍යය. මේ සඳහා නම්‍ය සහ වෙළඳපල අනුකූල විදේශ විනිමය හා පොළී අනුපාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුය. එම නිසා, විදේශීය වෙළඳාම හා ගෙවීම් පිළිබඳ ගණුදෙනු කෙරෙහි සීමාවන් පැනවීමට ශ්‍රී ලංකාව අදහස් නොකරයි.

නව සංවර්ධන ප්‍රවණතාවයක් දක්වන දකුණු ආසියාතු කලාපය තුළ පිහිටීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ස්වාභාවික වාසිය ප්‍රයෝජනයට

ගනිමින් අපනයන පෙරදැරි කරගත් සේවාවන් දියුණු කිරීම අප ආර්ථිකයෙහි ඉතා වැදගත් නව අංගයක් වන්නේය. අපගේ අනාගත දෘෂ්ටිය වනුයේ, ශ්‍රී ලංකාව කලාපයේ ප්‍රධාන මූල්‍ය සේවා සහ නැව් මගින් භාණ්ඩ පරිහරණය කරන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමය. මේ සඳහා 'සාර්ක්' රටවල කලාපීය සහයෝගිත්වය දියුණු කර ගැනීම හෝ ඉන්දියාව වැනි නුදුරු රටවල් සමග ද්විපාර්ශ්වික වශයෙන් වෙළඳම සහ ආයෝජනය වැඩි දියුණු කරගැනීම අවශ්‍ය වේ. කලාපීය රටවල් අතර වෙළඳාමට අදාළ තීරු බදු අඩු කිරීමෙන් සහ ආයෝජනය දිරි ගැන්වීමෙන් යහපත් ප්‍රතිඵල ලබා ගත හැකිවේ.

මෙසේ ඇප කැප වී සිටින සමස්ථ සංවර්ධන උපාය මාර්ගයෙන් අප අපේක්ෂා කරනුයේ චිරස්ථායි මානව සංවර්ධනයක් මෙරට ඇති කිරීමටය. සීඝ්‍ර ආර්ථික ප්‍රගතියෙන් සහ රැකියාවන් වැඩි දියුණු කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ මුළු ජනතාව අතර සාධාරණ අන්දමින් බෙදී යාමට සලස්වනු ලැබේ. ඒ අතර, පරිසරය විනාශවීම වළක්වා, ආරක්‍ෂා කොට, නැවත පරිසරය යහපත් අන්දමට දියුණු කිරීමට වග බලා ගනු ලැබේ. ජනතාවගේ සුභ සිද්ධිය සඳහා ආයෝජනය කිරීම මගින් ද ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම මගින් ද සාර්ථක ජිවිත ගත කිරීමේ හැකියාව සලසා දෙනු ඇත. අන්ත දිළිඳු ජනතාවට අනිවාර්යයෙන්ම විශේෂ ආරක්ෂාවත් සලසා, දුප්පත්කම තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන 'සමෘද්ධි ව්‍යාපාරය' මගින් දිළිඳු භාවයෙන් සහ විරැකියාවෙන් පෙළෙන ජනයාට ක්‍රියාශීලි ජීවනෝපායයන් ඇති කරනු ලැබේ. ඉතා ශුභුඩින් කියතොත්, මේ වනාහි සමාජ සංවර්ධනය සඳහා තරගකාරී වෙළඳපල ක්‍රමය යොදා ගැනීමේ උපාය මාර්ගයකි.

දේශපාලන වශයෙන් සලකා බලන විට මේ වූ කලී යහපත් සාධාරණ පාලනයකට ඇප කැප වීමකි. එවැනි පාලන තන්ත්‍රයකට ජනවාර්ගික සාධාරණයත්, මානව අයිතිවාසිකම් ආරක්‍ෂාවත්, ජන සම්මතවාදී ආයතනත් අඩංගු වේ. එවිට දේශපාලන තන්ත්‍රය කෙරෙහි ජනතා විශ්වාසය තහවුරු වනු ඇත. එසේ වන්නට නම් ජාතික හා රජයේ තීරණ ගැනීම පැහැදිලිව විද්‍යාමාන විය යුතුය. දූෂණයෙන් තොර විය යුතුය. මහජන සේවකයන් ඔවුන්ගේ කාර්යයන් සඳහා ජනතාවට වගකිය යුතුය.

මෙය වූ කලී සුන්දර වූ එහෙත් සපුරා ගැනීමට දුෂ්කර වූ සිහිනයකි. එය මුදුන් පත් කර ගැනීමට අප උත්සාහ දරන්නෙමු.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

BOI

SRI LANKA

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

තැ.පෙ 1768

14. ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත.

කොළඹ 01. ශ්‍රී ලංකාව.

ටෙලි: 448880. 422447. 434403-5. 435027-9

ෆැක්ස්: 94-1-447995